“ගැත්තන් උදෑසන අවදි වන සෑම දිනකම එහි මලක්වරුන් දෙදෙනෙකු පහළ නොවන දිනයක් නොමැත. ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙක්: “අහෝ දෙවිඳුනි! පිං සඳහා වියදම් කරන්නාට පසුවටත් ලබා දෙනු මැනව!” යැයි පවසන අතරම අනෙක් තැනැත්තා: “අහෝ දෙවිඳුනි! එය රඳා තබා ගන්නාට විනාශය ඇති කරනු මැනව.” යැයි පවසයි

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ගැත්තන් උදෑසන අවදි වන සෑම දිනකම එහි මලක්වරුන් දෙදෙනෙකු පහළ නොවන දිනයක් නොමැත. ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙක්: “අහෝ දෙවිඳුනි! පිං සඳහා වියදම් කරන්නාට පසුවටත් ලබා දෙනු මැනව!” යැයි පවසන අතරම අනෙක් තැනැත්තා: “අහෝ දෙවිඳුනි! එය රඳා තබා ගන්නාට විනාශය ඇති කරනු මැනව.” යැයි පවසයි.
[صحيح] [متفق عليه]

හිරු උදාවන සෑම දිනකම එහි මලක්වරුන් දෙදෙනෙකු පහළ නොවන දිනයක් නොමැත. ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙක් මෙසේ පවසයි: අහෝ දෙවිඳුනි! ඔබට අවනත වන කටයුතු වලදී ද, තම පවුලට, ආගන්තුකයන්ට අමතර කටයුතු සඳහා ද වියදම් කරන්නාට පසුවටත් ලබා දෙනු මැනව! ඔහු වියදම් කළ දෑ යහපතක් බවට පෙරළා දෙනු මැනව! එහි සමෘද්ධිය ඇති කරනු මැනව! යැයි පවසයි. අනෙක් තැනැත්තා: අහෝ දෙවිඳුනි! රැස් කරන්නාට විනාශය ඇති කරනු මැනව! ඔහුගේ වගකීම් ඉටු නොකර හිඳ, එය ලැබිය යුතු අයගෙන් වලක්වාගත් ඔහුගේ ධනය විනාශ කරනු මැනව යැයි පවසයි.

http://sunnah.global/hadeeth/si/show/3379